# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 888 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 26/05/2024 පැය 0855

# මාධ්‍ය නිවේදනය

**මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.**

2024.05.26 වන දින අළුයම් කාලයේදී ගල්ගමුව පොලිස් වසමේ මීඔය ආසන්නයේදී පාදෙනිය දෙස සිට අනුරාධපුර දෙසට ගමන් කල වෑන් රථයක් අනතුරට ලක් වී එක් අයෙකු මිය ගොස් තවත් පිරිසක් තුවාල ලබා ඇති බවට ලද තොරතුරක් මත ගල්මුව පොලිසිය විසින් විමර්ශන ආරම්භ කර ඇත.

අඟුණකොලපැලැස්ස ප්‍රදේශයේ පදිංචි 15 දෙනෙකු පමණ වූ පිරිසක් අනුරාධපුර වන්දනාගමනක යමින් සිටියදී වෑන් රථයේ රියදුරුට නින්දයාම හේතුවෙන් මී ඔය පාලමේ මැද දූපතේ ගැටී මාර්ගයෙන් ඉවතට පැන ගසක හැපීමෙන් මෙම අනතුර සිදුව ඇත. වෑන් රථයේ ගමන් ගත් එක් අයෙකු අනතුර සිදු වූ ස්ථානයේදීම මිය ගොස් ඇති අතර තවත් 13 දෙනෙකු ගල්ගමුව රෝහලට ඇතුලත් කර ඇති අතර ඉන් 07 දෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කර ඇත. ඔවුන් අතර කාන්තාවන් 07 දෙනෙකු සහ පිරිමි පුද්ගලයින් 06 දෙනෙකු වේ.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය ගල්ගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**